**මේ** දවස් වල මගේ ජීවිතය ගෙවෙන්නේ ඉතාමත් සතුටින්ය. එයට හේතුව මට හොද නරක කියා දෙමින් ගුණ නැණ ලබාදුන් පාසල් මෑණියන් තුරුලේ වැඩෙන මගෙ සහෝදරයන්ට මා ලද අධ්‍යාපනයෙන් බිඳක් ලබා දීම ට මට දැන් අවස්ථාව ලැබී ඇති නිසාවෙනි. අද මැයි පළ වැනිදාය. කම්කරු ජනතාව වෙනුවෙන් වෙන් වුණු දිනය ලෙසයි අද සැලකෙන්නේ. කම්කරු දිනයේදිවත් කම්කරු ජනයාට නිදහසක් හිමිවන්නේද යන්න මා තුළ මතු වන්නේ ප්‍රශ්නයකි. කම්කරුවන් වෙනුවෙන් පෙළපාලි යන කීදෙනෙකු නම් කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් හඩනගන්නෙද යන්න ප්‍රශ්නයකි. අද කම්කරු ජනතාව වෙනුවෙන් පෙළපාලි යන ඇතමුන් හෙට කම්කරුවන් දකින විට යන්නේ අහක බලාගෙනය. මේ කම්කරු දින මා සරසවියට යන්නේ කොළඹ පෙළපාලි යන විට සරසවි භූමිය තුළ අපේම ආදරණීය නංගිලා මල්ලිලා සංවිධානය කර ඇති අවුරුදු උත්සවයට සහාභාගි විම සඳහාය. මම සරසවියට යනවිට අපට වෙන් වු නේවාසිකාගාරයේ සිව්වන වසරෙහි කිසිවෙකුත් පැමිණ නැත. නේවාසිකාගාරයම පාලුවට ගිහින් මෙන් දැනුනි. සිතට දැණුනේද මහත් වේදනාවකි. අවුරු 3ක් පුරාවට මේ සරවිය තුළ අප කළ කී දෙවල් සිත තුළට නැගේ. සරසවියට පැමිණි පළමු දවසේ සිත තුළ තිබු භීතිය, ආශාව කිසිදිනක හෝ අමතක නොවේ. අපි සරසවියට පය තැබුවේ ඉතාමත් බිය ජනක ලෙසිනි. එයට හේතුව මාධ්‍ය මගින් ප්‍රකාශ කරන පරිදි අමාණුෂික නවක වදය අපි සැමටත් ලැබේ යැයි අපි සිතුවෙමු. එහෙත් මාධ්‍ය මගින් ප්‍රකාශ කල තරම් අපේ ජ්‍යේෂ්ඨයන් අමාණුෂික නොවන බව දැන ගැනිමට අපිට එතරම් කාලයක් ගත නොවිනි.

මගේ දුරකථනය නාද විමත් සමඟ දුරකථනය answer කළෙමි. මේ මම බෙරලු බන් උඹ කොහෙද ඉන්නේ ? මම අපේ room එකේ බන් . මේ කතා කරන්නේ මත් සමඟ එකට නේවාසිකාගාර කාමරයේ සිටි මගේ ගජ මිතුරාය. ඔයා ඔහොම්ම ඉන්න මම ඉක්මනට එනවා. දුරකථනය විසාන්ධි විය. බෙරලු එනකම් මම මගේ laptop එක on කරගත්තේ සිංදුවට සවන් යොමු කිරිමේ අදහසිනි. සරසවියට මුලින්ම එනවිට මටම කියා laptop එකක් අවශ්‍ය වුවත් laptop එකක් අරගෙන දෙන්න තරම් මගේ දෙමව්පියාන්ට වත්කමක් නොවීය. අම්මේ මට laptop එකක් ඕනේ යැයි දවසක් පැවසු විසූ ඇය කිව්වේ අපේ මේ දුප්පත්කම නිසා උඹලාට ඕන කරන දෙවල්වත් අරගෙන දෙන්න විදිහක් නැහැනෙ. එහෙත් අම්මා දුපපත් කියන වචනය පාවිච්චි කළාට ඒ දූප්පත්කම නිසා නොව හිඟකම නිසා ඇති වුවක් බව මම ප්‍රකාශ කිරීමට ගියේ නැත. දූප්පත්කම කියාන්නේ මූලික අවශ්‍යතාවයන්වත් සපුරා ගැනීමට තරම් ප්‍රමාණවත් ආදායමක් නොලැබිමයි.

බෙරලු කාමරයට ආ විගස මා වැළද ගත්තේ හරියට පුස් පැටවෙකු තුරුලු කරගන්නා විලසිනි. ඒ සහෝදර බැදීම උපතින් ගෙන ආ සහෝදර බැදීමට වඩා උතුම් බැදිමකි. අවුරුදු උත්සවය පටන්ගන්නත් ළගායි අපි එහෙට යමුද ? මම බෙරලුගෙන් ඇසුවෙමි. අපි තව ටිකකින් යමු ඔහුගේ පිලිතුර විය. training කටයුතු වල නියලිලා ඉන්න සිව්වන වසරේ අපේ batch එකේ එකා දෙන්නා දැන් හොස්ටල් එකට ළගා වෙයි. අපි සියලු දෙනාම අවුරුදු උත්සය දෙසට ගියහ. සරන් කමිස, ඔසරි වලින් සැරසී සිටින මල්ලිලා නංගිලා අපිව බුලත් දි සාදරයෙන් පිළිගත්තෙ අපි ඔහුන්ගේ වැඩි හිටියන් ලෙසින. ඔසරියකින් සැරසුනු එක්තරා ලස්සන නැගණියක් මා අසලට විත් සුභ අලුත් අවුරුද්දක් අයියේ කියා මාව පිළිගත්තේය. ඒ නංගිව මුලින්ම මට හමු වුනේ බස් එකේ ගෙදර එන අතරවාරයේදීය. ඒ අතර මගේ සිත තුළ පිවත් වන එක්තරා සරසවි සිසුවියක් ඒ අසලම වේ. ඇය නමින් තරණි ය . ඇයට සරසවිය තුළ ලැබි ඇති නම පැහැසරිය. ඒ නම ඇයට ලැබී ඇත්තේ ඇය එතරම්ම පැහැසර නිසාවෙනි. මම දැන් කුමක් කළ යුතුදැයි සිතා ගත නොහැක. මට සුභ අලුත් අවුරුද්දක් කියා මා පිළිගත් ඒ නැගණියත් සමඟ කථා කරන්නේ ද , නැතහොත් මගේ සිත තුළ පමණක් පිවත් වන තරණි සමඟ කතා කරන්නේද යන්න මා සිත තුළ ඇත්තේ ගැටලුවකි.



*Do you want to know who you are ? Don't ask. Act ! Action will delineate and define you*

*ඔබට ඔබ කවුද කියා දැනගැනිමට අවශ්‍යද? ප්‍රශ්න නොකරන්න. ක්‍රියාත්මක වන්න. ක්‍රියාවන් ඔබට පහදා දෙනු ඇත.*

Thomas Jefferson

01. පහත සංකල්ප හඳුනා ගනිමින් එම සංකල්ප පැහැදිලි කරන්න.

- ★ හිඟකම
- ★ තේරීම
- ★ ආවස්ථික පිරිවැය

02. මෙම සංකල්ප අතර පවත්නා සම්බන්ධතාවය පෙන්වා දෙන්න

03. හිඟකම යන්නෙන් අදහස් වන්නේ කුමක් ද ?

04. හිඟකම පවතින විට අවශ්‍යයෙන්ම තේරීමක් කළ යුක්තේ ඇයි?

05. මූලික ආර්ථික ප්‍රශ්න තුන කවරේ ද ?

06. ආවස්ථික පිරිවැය නිර්වචනය කරන්න.

01. භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී සෑම සමාජයක් ම තෝරා ගැනීමේ ප්‍රශ්නයකට මුහුණ දේයැයි අප කියන්නේ ඇයි ?

i මිනිස් අවශ්‍යතා අසීමිත වීම.

ii ආර්ථිකය ඌණ සංවර්ධිත එවා වීම.

iii මිනිස් අවශ්‍යතාවලට සාපේක්ෂව සම්පත් හිඟවීම සහ සම්පත් විකල්ප අයුරින් භාවිත කළ හැකි වීම.

iv කිසියම් භාණ්ඩ සහ සේවා ප්‍රමාණයක් විවිධ නිෂ්පාදන සාධක සංයෝග යොදා ගෙන නිපැදවීමට හැකි වීම.

02. නොමිලයේ සැපයෙන පහත දැක්වෙන භාණ්ඩ හා සේවා අතරින් ආවස්ථික පිරිවැයක් පවතින ඒවා මොනවා ද ?

i රජයෙන් සැපයෙන නිදහස් අධ්‍යාපනය.

ii රෙදි වේලීම සඳහා භාවිත කෙරෙන හිරු එළිය.

iii සිසුන්ට ලැබෙන මහපොළ.

iv සංචාරක ආකර්ෂණයක් බවට පත් ව ඇති දිය ඇල්ලක්.

03.ආර්ථික භාණ්ඩයක් යනු කුමක් ද ?

i ලාභයක් සහිත ව අලෙවිකරනු ලබන භාණ්ඩයක්.

ii වැඩිවන කර්යක්ෂමතා තත්ත්වයක් යටතේ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩයක්.

iii පෞද්ගලික අංශයෙන් පමණක් සැපයිය හැකි භාණ්ඩකි.

iv ආවස්ථික පිරිවැයක් සහිත භාණ්ඩයකි.

v රාජ්‍ය අංශයෙන් පමණක් සැපයිය හැකි භාණ්ඩකි.

04.සෑම රටකකටම පොදු මූලික ආර්ථික ප්‍රශ්නය වන්නේ,

i විශාල මුදල් ප්‍රමාණයක් සීමිත භාණ්ඩ ප්‍රමාණයක් පසුපස හඹායාමයි.

ii හිඟ ස්වභාවික සම්පත් අධික ලෙස ප්‍රයෝජනයට ගැනීමයි.

iii පරිසරය දූෂණය වීමයි.

iv අසීමිත වුවමනාවන් සපුරා ගැනිමට සම්පත් හිඟකම බාධවක් වීමයි.

v දරිද්‍රතාවය වැඩිවීමයි.

05. හිඟකම පිළිබඳ ප්‍රශ්නය

i මිශ්‍ර ආර්ථික ක්‍රමයක් පවත්නා රටවල පමණක් දක්නට ලැබේ.

ii මිල ගණන් පහල දැමීමට හැකිනම් මුළුමනින් ම තුරන් කළ හැක.

iii යන්නෙන් අදහස් වන්නේ සමහර භාණ්ඩ හිඟ බවයි.

iv පැන නගින්නේ පවත්නා සම්පත් වලින් මිනිස් වුවමනා සපුරාලිය නොහැකි බැවිනි.

v දැනට පවතින ආර්ථික වෘද්ධිය තුළින් විසඳා ගත හැක.

06. ආර්ථික විද්‍යාවට අනුව නොමිල භාණ්ඩයක් : රෙරුෑ ටදදා * යන්න වඩාත් හොඳින් විස්තර කළ හැක්කේ

i පාරිභෝගිකයාට ශුනය මිලකට සැපයෙන භාණ්ඩයක් වශයෙනි.

ii රජය විසින් නොමිලයේ ලබාදෙන භාණ්ඩයක් වශයෙනි.

iii භූමියෙන් හෝ මුහුදෙන් හෝ සෘජුව ලබාගන්නා භාණ්ඩයක් වශයෙනි.

iv ස්ථාවර ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවිය හැකි භාණ්ඩයක් වශයෙනි.

v ස්ථාවර ආවස්ථික පිරිවැයක් යටතේ නිපදවිය හැකි භාණ්ඩයක් වශයෙනි.

07. පෞද්ගලික විශ්ව විද්‍යාලයක ඉගනීමේ ආවස්ථික පිරිවැයට පහත සඳහන් දෑ අතුරෙන් එක් දෙයක් හැර අන් සියල්ලක් ම ඇතුලත් වේ. එලෙෂ ඇතුලත් නොවනුයේ,

i අවශ්‍ය කරන පාඨ ග්‍රන්ථ මිලට ගැනීමේ වියදමයි.

ii පාඨමාලා ගාස්තුවයි.

iii විශ්ව විද්‍යාලයේ ඉගෙනීමට යාම නිසා එම කාලය තුළ උපයා ගත හැකිව තිබූ ආදායම අහිමිවීමයි.

iv විශ්ව විද්‍යාලයේ ඉගන ගන්නා කාළයේ දී කොන්ඩය කැපීමට වැය කිරීමට සිදුවන මුදල් ප්‍රමාණයයි.

v සටහන් ලියා ගැනීමට අවශ්‍ය කරන කඩදාසි සහ පැන්සල් සඳහා වැය වන මුදල් ප්‍රමාණයයි.

08. ආර්ථික භාණ්ඩයක් යනු,

i නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැයක් හට ගන්නා භාණ්ඩයකි.

ii නිෂ්පාදනයේ දී සම්පත් උපයෝජනය නො කෙරෙන භාණ්ඩයකි.

iii තරඟකාරි ලෙස සපයන භාණ්ජයකි.

iv නිෂ්පාදනයෙ දී ලාභයක් ජනනය කෙරෙන භාණ්ඩයකි.

v ශුන්‍ය මිලක දී වුව ද ලබාගත හැක්කකි.

